# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 747/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 02/05/2024 පැය 1750

**මැයි දින රැස්වීම් සහ පෙළපාලි සාර්ථකව පැවැත්වීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම පිළිබඳව ස්තූතිය පුද කිරීම.**

2024.05.01 වන දිනට යෙදුනු ලෝක කම්කරු දිනය වෙනුවෙන් දිවයින පුරා පවත්වන ලද මැයි දින පෙළපාලි සහ රැස්වීම් සාර්ථකව පවත්වා අවසන් කිරීමට හැකි විය. කිසිදු ප්‍රදේශයකින් විශේෂිත සිදුවීම් කිසිවක් වාර්තා නොවූ අතර කොළඹ නගරය ඇතුළු ප්‍රධාන නගරවල පවත්වන ලද සියළුම රැස්වීම් හා පෙළපාලි සඳහා පැමිණි මහජනතාවට ගැටළුකාරී තත්ත්වයක් ඇති නොවන ආකාරයට කටයුතු කර එය අවසන් කර විසිර යාමට මනා සහයෝගයක් දක්වා තිබුණි.

එම මහජනතාව එවැනි ආකාරයට කටයුතු කිරීම සඳහා මෙහෙය වූ සියළුම දේශපාලන පක්ෂ මෙන්ම වෙනත් වෘත්තීය සමිති නියෝජනය කරමින් පොලිසිය සමඟින් සම්බන්ධ වෙමින්, සාකච්ඡා පවත්වමින් එකඟතාවයන් අනුව කටයුතු කිරීම පිළිබඳව සියළුම සංවිධායක මහතුන් වෙත පොලිස්පතිතුමාගේ සහ ශ්‍රී ලංකා පොලිසියේ කෘතඥ පූර්වක ස්තූතිය පුදකරන අතර මැයි දින පෙළපාලි සහ රැස්වීම් සම්බන්ධව දෛනිකව පොලිසිය මඟින් නිකුත් කරන ලද උපදෙස් හා නිවේදන මහජනතාව අතරට ගෙන යමින් ඔවුන්ව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය ආයතන සහ මාධ්‍යවේදීන් විසින් ඉටුකරන ලද කාර්ය භාරය වෙනුවෙන්ද පොලිස්පතිතුමා ඇතුළු ශ්‍රී ලංකා පොලීසියේ සුවිශේෂී ස්තූතිය පුදකරමු.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**